# 2022 මාර්තු මස 15 වන දින ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභා රැස්වීම් වාර්තාව

දිනය සහ වේලාව :- 2022.03.15 පෙ:ව: 09.30

ස්ථානය :- ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව

පැමිණීම:-

| | |
|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති |
| 03. ආර්.පී. ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. ඩී.ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07. ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 08. චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 09.ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 11. ඩබ්.එම්. උදය කුමාරබණ්ඩාරමහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13.එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 17. ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 18. එස්.පී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. රාජකුමාර් විදුෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 20. එන්.එම්. නන්දාවතී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 21. ආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

නොපැමිණීම:-

| | |
|---|---|
| 01. ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 02. එච්.පී.ආනන්ද කුලතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

ගරු සභාපතිතුමා

ගරු සභාපතිතුමා විසින් මහා සභා රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් සියලුදෙනා හා පැමිණ සිටි සියලුදෙනාම ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී.

සභා රැස්වීමට සහභාගීවූ සියල්ලෝම තම ආගම සිහිකර ජාතික ගීය ගායනා කිරීමෙන් පසුව මියගිය රණවිරුවන් හා මියගිය පළාත් පාලන ආයතන නියෝජිතයින් සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වන ලදී. ඉන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් න්‍යායපත්‍රානුකූලව පසුගිය සභා වාර්තාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

01.පසුගිය සභා වාර්තාව සම්මත කර ගැනීම

2022 පෙබරවාරි මස 15 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කර ගැනීමට ගරු සභාපතිතුමාවිසින් ගරු මහාසභාවටඉදිරිපත්කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාර්තාවේ 23 වන පිටුවෙහි අනු අංක 06:08 හි “ දොළොස්බාගේ කොට්ඨාශය භාර මන්ත්‍රීවරුන් ” යන්න සංශෝධනය කර එක් මන්ත්‍රීවරයෙකුගේ නමක් පමණක් යෙදීම සුදුසුයි. එය සංශෝධනය විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා පෙ:ව: 9.45 ට සභා ගර්භයට පැමිණෙන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2022.02.15 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට මා විසින් යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

යෝජනා ස්ථිරත්වයෙන් අනතුරුව 2022.02.15 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

02. ගරු සභාපතිතුමාගේ විශේෂ  නිවේදන - ඇත

01. 2021 දෙසැම්බර් මාසයට අදාළ මහා සභා රැස්වීම් වාර්තාවෙහි නිරීක්ෂණ ඇතුළත් කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරමි.

02. රට තුළ පවතින විදුලි අර්බුදය හමුවේ විදුලිය අරපිරිමැස්මෙන් පරිහරණය කිරීම සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ මධ්‍යම පළාතේ ආණ්ඩුකාරතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරමි.

03. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරය) 66 අ (I) (අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වූ සභික ධුරයන් සඳහා නවරත්න මුදියන්සේලාගේ නන්දාවතී මහත්මිය

සහ රහල ගල්පොත්තේ ගෙදර ඉසංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය තෝරා පත්කර ගැනීමට අදාළ අංක 2266/74 හා 2022.02.12 වන දිනැති අති විශේෂ ගැසට් නිවේදනය අනුව කටයුතු කරන බව මෙයින් නිවේදනය කරමි.

04. පළාත් පාලන ආයතන වල ගරු මහජන නියෝජිතයන් සහ නිලධාරීන්ට පරිගණක දැනුම ලබාදීම සහ එම දැනුම යාවත්කාලීන කිරීමේ අරමුණින් පළාත් පාලන ආයතන පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශය 2022 වසර සඳහා පරිගණක සහතිකපත්‍ර පාඨමාලාව සඳහා 2022 මාර්තු සිට පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම පාඨමාලාව සෑම සතියකම අඟහරුවාදා දානයේ පෙ:ව: 09.00 සිට ප:ව: 04.00 දක්වා පැවැත්වෙන අතර පාඨමාලා ගාස්තු රුඃ 30,000.00ක් බව දන්වා ඇත. එම පාඨමාලාව හැදෑරීමට කැමති සභිකයින් වේ නම් ඒ සඳහා අයදුම් කරන ලෙස නිවේදනය කරමි.

05. 2021.12.31 වන දිනට අදාළව ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ භාණ්ඩ වෙන්දේසිය 2022.03.11 වන දින පැවති අතර එහිදී භාණ්ඩ වෙන්දේසි කිරීම මත ලද මුළු ආදායම රුඃ 30,060.00ක් බව නිවේදනය කරමි.

03. සභාවට ලැබී ඇති සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන - නැත

04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත

05.යථා පරිදි කල්දී ඇති යෝජනා - ඇත

05:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

05:01:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරලේ පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමෙන් පසු ඉතිරි වී ඇති ගොඩනැගිලි ද්‍රව්‍ය වෙන්දේසි කිරීමට අදාළ තක්සේරු වාර්තාව 2022.02.24 වන දින තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාව අනුව අදාළ අබලි ද්‍රව්‍ය ඉතාමත් අවම මිළට වෙන්දේසි කරන ලෙස එම වාර්තාවේ සඳහන් කර ඇත. එහෙත් අදාළ අබලි ද්‍රව්‍ය යොදාගෙන උලපනේ ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ පවතින ගොඩනැගිල්ලෙහි වහලය දීර්ඝ කිරීම මගින් එහි ඉඩකඩ ප්‍රමාණය වැඩි කර ගැනීම සුදුසු බවටත් එහි අනෙකුත් ද්‍රව්‍ය යොදාගෙන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමත් ඉතිරි වුවහොත් එම භාණ්ඩ තක්සේරු වාර්තාව අනුව වෙන්දේසි කිරීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

අප ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත පැරණි ප්‍රාදේශීය සභා භූමියේ පිහිටි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමෙන් පසුව එයින් ඉතිරිවූ ද්‍රව්‍ය වෙන්දේසි කිරීමට තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කළ අතර එම දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති වාර්තාවට අනුව ඉතාමත් අවම වෙන්දේසි මිළක් නියමවී ඇත. එම අවම මිළට මෙම ද්‍රව්‍ය වෙන්දේසි කරනවාට වඩා එම ද්‍රව්‍ය යොදාගෙන උලපනේ ඩෙන්මාර්ක් කසළ අංගනයේ ගොඩනැගිල්ලෙහි වහලය දීර්ඝ කර ගැනීම සහ එහි ඉඩකඩ ප්‍රමාණය වැඩි කර ගැනීමත් එහි අනෙකුත් ද්‍රව්‍ය යොදාගෙන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සුදුසු බවත් ඉතිරි වන ද්‍රව්‍ය තක්සේරු වාර්තාව අනුව වෙන්දේසි කිරීම සුදුසු බවටත් මා යෝජනා කරනවා. මෙම යෝජනාව පිළිබඳව වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතා

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාවේ අවම මිළ යන්න උපරිම ලෙස සඳහන් විය යුතුයි. අපි වෙන්දේසි කරන්නේ උපරිම මිළකටයි. මෙම යෝජනාව ඉතාම දෝෂ සහගත යෝජනාවක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, පැරණි ප්‍රාදේශීය සභා භූමියේ පිහිටි ගොඩනැගිල්ලේ ඉවත් කරන ලද අබලි ද්‍රව්‍ය දැනට කුරුඳුවත්ත ක්‍රීඩාපිටියේ ගොඩගසා තිබෙනවා. එම ස්ථානයේ තිබෙන යකඩ බඩු තවම තෙමෙනවා. මේවාට තවම අපේ සභාවේ නිලධාරීන් පියවරක් ගෙන නෑ. ඒ පිළිබඳව සොයා බලා කටයුතු කිරීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

ගරු නාලක මන්ත්‍රීතුමා, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරඇත්තේ අවම මිළක් යන්නයි එයින් අදහස් කර ඇත්තේ. එවැනි අවම මිළකට මෙම ද්‍රව්‍ය විකුණනවාට වඩා මෙම ද්‍රව්‍ය අපි ප්‍රයෝජනයට ගැනම සුදුසුයි. මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවනබව සහ විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණය:-

ඒ අනුව 2021 අප ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත පැරණි ප්‍රාදේශීය සභා භූමියේ පිහිටි ගොඩනැගිල්ල කඩා ඉවත් කරන ලද ද්‍රව්‍ය හා කුරුඳුවත්ත ක්‍රීඩාංගනයේ ගලවා ඉවත් කරන ලද අත් වැටෙහි ද්‍රව්‍ය යොදාගෙන උලපනේ ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලෙහි වහලය දීර්ඝ කිරීම මගින් එහිඉඩකඩ ප්‍රමාණය වැඩිකර ගැනීම සුදුසු බවටත් එහි අනෙකුත් ද්‍රව්‍ය යොදාගෙන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමටත් ඉතිරි වන ද්‍රව්‍ය තක්සේරු වාර්තාව අනුව වෙන්දේසි කිරීම සුදුසු බවටත් ගරු මහා සභාවතීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

උඩහේන්තැන්න මැදගොඩ හංදියේ ඉදිකිරීමට යෝජිත වෙළඳ හා බහුකාර්යය ගොඩනැගිල්ලේ කඩ කාමර දිගුකාලීනව බදු දීම වෙනුවෙන් විවෘත ටෙන්ඩර් අයදුම්පත් භාර ගැනීම 2020.02.24 වන දිනෙන් අවසන් වූ අතර එම දින දක්වා ලැබී තිබුණේ ටෙන්ඩර් අයදුම්පත් 06ක් පමණි. ටෙන්ඩර් අයදුම්පත් ලබා ගැනීමට අපේක්ෂිතව සිටි පුද්ගලයින් ටෙන්ඩර් දැන්වීම නොදුටු බව දන්වමින් ඔවුන් විසින් නැවත දින දීර්ඝ කර දෙන ලෙස ලිඛිතව සහ වාචිකව ඉල්ලීම් කර ඇත. ටෙන්ඩර් අයදුම්පත් ප්‍රමාණය අදාළ ටෙන්ඩරය විවෘත කිරීම සඳහා ප්‍රමාණවත් නොවීම යන කරුණු මත ටෙන්ඩර් අයදුම්පත් භාර ගන්නා දිනය 2022.03.15 වන දින දක්වා දීර්ඝ කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

උඩහේන්තැන්න මැදගොඩ හංදියේ ඉදිකිරීමට යෝජිත වෙළඳ හා බහුකාර්යය ගොඩනැගිල්ලේ කඩ කාමර දිගුකාලීනව බදු දීම වෙනුවෙන් විවෘත ටෙන්ඩර් අයදුම්පත් භාර ගැනීම 2020.02.24 වන දිනෙන් අවසන් වූ අතර එම දින දක්වා ලැබී තිබුණේ ටෙන්ඩර් අයදුම්පත් 06ක් පමණි. ටෙන්ඩර් අයදුම්පත් ලබා ගැනීමට අපේක්ෂිතව සිටි පුද්ගලයින් ටෙන්ඩර් දැන්වීම නොදුටු බව දන්වමින් ඔවුන් විසින් නැවත දින දීර්ඝ කර දෙන ලෙස ලිඛිතව සහ වාචිකව ඉල්ලීම් කර ඇත. දැනට ලැබී

ඇති ඉල්ලුම් පත් ටෙන්ඩරය විවෘත කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් ටෙන්ඩර් අයදුම්පත් භාර ගන්නා දිනය 2022.03.15 වන දින දක්වා දීර්ඝ කර ගැනීම සුදුසු බවටත් එම ටෙන්ඩරය 2022.03.16 වන දින පෙ:ව: 10.00ට විවෘත කිරීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරනවා. ඒ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව සහ විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණය:-

ඒ අනුව උඩහේන්තැන්න මැදගොඩ හංදියේ ඉදිකිරීමට යෝජිත වෙළඳ හා බහුකාර්යය ගොඩනැගිල්ලේ කඩ කාමර දිගුකාලීනව බදු දීම වෙනුවෙන් ඊට අදාළ ටෙන්ඩර් අයදුම්පත් භාර ගන්නා දිනය 2022.03.15 වන දින දක්වා දීර්ඝ කර ගැනීම සුදුසු බවටත් එම ටෙන්ඩරය 2022.03.16 වන දින පෙ:ව: 10.00ට විවෘත කිරීම සුදුසු බවටත්ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කරන ලද රු: 500,000.00ට වඩා වැඩි වටිනාකමක් ඇති පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු මුදල් ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| අනු අංකය | සංවර්ධන ව්‍යාපෘතිය | ගෙවීම් සිදුකරන ලද සමිතිය/ ආයතනය | මුදල |
|---|---|---|---|
| 01 | සභා අරමුදල් 2022 යටතේ ක්‍රියාත්මක කරනු ලබන කුරුදුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම ව්‍යාපෘතියේ අත්තිකාරම් මුදල් ගෙවීම | කවිදු බිල්ඩර්ස්, 17/20, අරංගල, නත්තරම්පොත, මහනුවර | **10,663,260.00** |
| 02 | පුස්තකාල සංවර්ධන වැඩසටහන 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද කෙලිගෘප් පුස්තකාලය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම | ග්‍රාම සංවර්ධන ප්‍රාදේශිය බල මණ්ඩලය | **1,003,784.47** |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

සභා අරමුදල් 2022 යටතේ ක්‍රියාත්මක කරනු ලබන කුරුදුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම ව්‍යාපෘතියේ අත්තිකාරම් මුදල වන රු:10,663,260.00ක මුදල මහනුවර, නත්තරම්පොත, අරංගල, 17/20, කවිදු බිල්ඩර්ස් ආයතනයට ගෙවීමත් පුස්තකාල සංවර්ධන වැඩසටහන 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද කෙලිගෘප් පුස්තකාලය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ මුදල වන රු: 1,003,784.47 ක මුදල ග්‍රාම සංවර්ධන ප්‍රාදේශිය බල මණ්ඩලය වෙත ගෙවිමත් සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

ගරු සභාපතිතුමනි,  මෙම යෝජනාව සඳහා මාගේ විරුද්ධත්වය මා ප්‍රකාශ කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව සඳහා මාගේ විරුද්ධත්වය මා ප්‍රකාශ කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එන්.එම්. නන්දාවතී නවරත්න මහත්මිය

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව සඳහා මාගේ විරුද්ධත්වය මා ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමා

එසේනම් මෙම යෝජනාවට ඡන්ද විමසීමක් සිදු කළයුතුයි. මුලින්ම පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන්න.

මෙම යෝජනාවට පක්ෂව ඡන්දය ලබා දීම ආරම්භ කරන්න. අත් ඔසවා ඡන්දය ප්‍රකාශ කරන්න.

| | | |
|---|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති | - පක්ෂයි |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති | - පක්ෂයි |
| 03. ආර්..පී.ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 05.ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 06. එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 07. ඩී.පී.පී. ඩබ්. පී. ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 08. චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - පක්ෂයි |
| 09. ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 10.සුබෝධා ලක්ෂානි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - පක්ෂයි |
| 11. ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 12. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 13. එම්.ඒ.සුමේධඅලුත්ගමගේමහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී | - පක්ෂයි |
| 14. එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - පක්ෂයි |
| 15. එම්.පී. අබේරත්නබණ්ඩාරමහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී | - පක්ෂයි |
| 16. ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රිනී | - පක්ෂයි |
| 17. රාජකුමාර් විදුෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රිනී | - පක්ෂයි |

මෙම යෝජනාවට විපක්ෂව ඡන්දය ලබා දීම ආරම්භ කරන්න. අත් ඔසවා ඡන්දය ප්‍රකාශ කරන්න.

| | | |
|---|---|---|
| 01. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - විපක්ෂයි |
| 02. එස්.පී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී | - විපක්ෂයි |
| 03. එන්.එම්. නන්දාවතී නවරත්න මහත්මිය | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රිනී | - විපක්ෂයි |

අද දින නොපැමිණි අය:-

01. ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

01. එච්.පී.ආනන්ද කුලතිලක මහතා — ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

ගරු සභාපතිතුමා

**මෙම යෝජනාව සඳහා පක්ෂව ඡන්ද 17ක්ද විපක්ෂව ඡන්ද 03 ක්ද ලැබී තිබෙනවා. ඒ අනුව මෙම යෝජනාව වැඩි ඡන්ද14 කින් සම්මත වූ බව ප්‍රකාශ කරනවා. මේ පිළිබඳවවෙනත්අදහසක්ඉදිරිපත්නොවනබවපෙනීයනවා.**

තීරණය:-

**ඒ අනුවසභා අරමුදල් 2022 යටතේ ක්‍රියාත්මක කරනු ලබන කුරුදුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම ව්‍යාපෘතියේ අත්තිකාරම් මුදල වන රු:10,663,260.00ක මුදල මහනුවර, නත්තරම්පොත, අරංගල, 17/20, කව්දු බිල්ඩර්ස් ආයතනයට ගෙවීමත් පුස්තකාල සංවර්ධන වැඩසටහන 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද කෙලිගෘප් පුස්තකාලය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ මුදල වන රු: 1,003,784.47 ක මුදල ග්‍රාම සංවර්ධන ප්‍රාදේශිය බල මණ්ඩලය වෙත ගෙවීමත් සුදුසු බවටගරු මහා සභාවතීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව බහුතර කැමැත්ත මත සභා සම්මත විය.**

05:01:04 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

**සභා අරමුදල් යටතේ 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ගරු සභිකවරුන් විසින් ඉදිරිපත් කළ සංවර්ධන ව්‍යාපෘති සංශෝධනය කර නව යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.**

| අනු අංක | ව්‍යාපෘතිය | කොට්ඨාශය | ගම/ වීදිය | යෝජනාව ඉදිරිපත් කල සංවිධානය/ආයතනය / නිලධාරියා | දළ ඇස්තමේන්තු මුදල රුපියල් | | ප්‍රතිලාභි සංඛ්‍යාව | වගකීම | අධීක්ෂණය | වැඩ අවසන් කළ යුතු දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | රුපියල් | ශත | | | | |
| 1 | ජයමාලපුර 09 වන පටුමග සංවර්ධනය කිරීම | ඇත්ගාල | ජයමාලපුර | ප්‍රදේශවාසීන් | 500000 | 00 | පවුල් 30 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරීන් /විෂය නිලධාරී | සභාපති / ලේකම් | 2022.12.31 |
| 2 | ඇත්ගාල නැගෙනහිර සොහොන අසලින් යන පාර සංවර්ධනය කිරීම | ඇත්ගාල | ඇත්ගාල නැගෙනහිර | ග්‍රාම සංවර්ධන සමිතිය | 500000 | 00 | පවුල් 25 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරීන් /විෂය නිලධාරී | සභාපති / ලේකම් | 2022.12.31 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **3** | සිංහපුර ගමමැද පාර සංවර්ධනය කිරිම | ඇත්ගාල | සිංහපුර | ප්‍රගති ග්‍රාම සංවර් ධන සමිතිය | 500000 | 00 | පවුල් **35** | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | **2022.12.31** |
| 4 | ගැමුණුපුර අංගේ පොදු ළිද අවට නිවාස වලට යන පාර සංවර්ධනය කිරිම | වැටකේ‍ෙ දනිය | ගැමුණුපු ර | ප්‍රදේශ වාසින් | 200000 | 00 | පවුල් 14 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | **2022.12.31** |
| **5** | ගෝනවත්ත ගැමුණුපුර මාර්ගය සංවර්ධනය කිරිම | වැටකේ‍ෙ දනිය | ගැමුණුපු ර | ප්‍රදේශ වාසින් | 200000 | 00 | පවුල් **22** | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | **2022.12.31** |
| **6** | බොස්වෝඩි පහළ මාර්ගය සංවර්ධනය කිරිම | වැටකේ‍ෙ දනිය | බොස්වෝ ඩි | ප්‍රදේශ වාසින් | 400000 | 00 | පවුල් **58** | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | **2022.12.31** |
| **7** | ගෝනවත්ත අතුරු මාර්ගය හා බැම්ම ඉදිකිරිම | වැටකේ‍ෙ දනිය | ගෝනවත් ත | ප්‍රදේශ වාසින් | 150000 | 00 | පවුල් **24** | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | **2022.12.31** |
| 8 | වැටකේ‍ෙදනිය පොදු ළිද සංවර්ධනය කිරිම | වැටකේ‍ෙ දනිය | වැටකේ‍ෙ දනිය | ප්‍රදේශ වාසින් | 50000 | 00 | පවුල් **20** | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | **2022.12.31** |
| **9** | ස්වේච්ඡා සමිතිවලට පුටු ලබාදිම | වැටකේ‍ෙ දනිය | වැටකේ‍ෙ දනිය | සමිති | 500000 | 00 | පවුල් **15** | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | **2022.12.31** |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | මලංගමුව සිට සස්සිරිගොඩ මාර්ගය සංවර්ධනය කිරිම | ගිරාඋල්ල | මලංගමුව | ප්‍රදේශ වාසින් | 250000 | 00 | පවුල් 21 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්‍ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 11 | ගගේවත්ත මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරිම | ගම්පොල වෙල | ගගේවත් ත | ප්‍රදේශ වාසින් | 250000 | 00 | පවුල් 25 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්‍ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 12 | හලාගම බ්‍රේසයිඩ් පාර සංවර්ධනය කිරිම | වල්ලහ ගොඩ | හලාගම | ප්‍රදේශ වාසින් | 500000 | 00 | පවුල් 35 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්‍ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 13 | හැරකොල බ්‍රේසයිඩ් පාර සංවර්ධනය කිරිම | වල්ලහ ගොඩ | හැරකො ල | ප්‍රදේශ වාසින් | 500000 | 00 | පවුල් 45 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්‍ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 14 | පහල කුඩමාකේ පාර සංවර්ධනය කිරිම | වල්ලහ ගොඩ | පහල කුඩමාකේ | ප්‍රදේශ වාසින් | 500000 | 00 | පවුල් 32 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්‍ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 15 | බෝගහකොලේ මැදපාර සංවර්ධනය කිරිම | යටපාත | බෝගහ කොලේ | ප්‍රදේශ වාසින් | 300000 | 00 | පවුල් 24 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්‍ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 16 | පිටකන්ද මැදපාර සංවර්ධනය කිරිම | යටපාත | පිටකන්ද | ප්‍රදේශ වාසින් | 200000 | 00 | පවුල් 20 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්‍ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 17 | තිබ්බුටුපොල කුරුපැලැල්ල පඩිපෙළ ඉදිකිරීම | යටපාත | තිබ්බුටුපොල | ප්‍රදේශ වාසීන් | 200000 | 00 | පවුල් 33 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරීන් /විෂය නිලධාරී | සභාපති / ලේකම් | 2022.12.31 |
| 18 | යටපාත උඩහගෙදර පොදු ළිද සංවර්ධනය කිරීම | යටපාත | යටපාත | ප්‍රදේශ වාසීන් | 100000 | 00 | පවුල් 15 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරීන් /විෂය නිලධාරී | සභාපති / ලේකම් | 2022.12.31 |
| 19 | යටපාත ගල්කඩුල්ල මාර්ගය සංවර්ධනය කිරීම | යටපාත | ගල්කඩුල්ල | ප්‍රදේශ වාසීන් | 200000 | 00 | පවුල් 35 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරීන් /විෂය නිලධාරී | සභාපති / ලේකම් | 2022.12.31 |
| 20 | යටපාත ඉඩමවත්ත පාර සංවර්ධනය කිරීම | යටපාත | ඉඩමවත්ත | ප්‍රදේශ වාසීන් | 500000 | 00 | පවුල් 14 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරීන් /විෂය නිලධාරී | සභාපති / ලේකම් | 2022.12.31 |
| 21 | බෝගොල්ල ජනක මහතාගේ නිවස අසලින් වැටී ඇති පාර සංවර්ධනය කිරීම | උළපනේ | බෝගොල්ල | ප්‍රදේශ වාසීන් | 150000 | 00 | පවුල් 30 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරීන් /විෂය නිලධාරී | සභාපති / ලේකම් | 2022.12.31 |
| 22 | රජඇල බෝධිය මාර්ගයේ තිලකරත්න මහතාගේ නිවස ළඟ ඇති බෝක්කුව සෑදීම | උළපනේ | උළපනේ | ප්‍රදේශ වාසීන් | 200000 | 00 | පවුල් 25 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරීන් /විෂය නිලධාරී | සභාපති / ලේකම් | 2022.12.31 |
| 23 | බෝගොල්ල ප්‍රධාන පාරේ සිට මාවෙල පාරට බහින පඩිපෙළ සෑදීම | උළපනේ | බෝගොල්ල | ප්‍රදේශ වාසීන් | 150000 | 00 | පවුල් 22 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරීන් /විෂය නිලධාරී | සභාපති / ලේකම් | 2022.12.31 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 24 | මලවත්ත පහළ මාර්ගයේ සිට මල්වත්ත උඩමාර්ගය දක්වා අතුරු මාර්ගයේ පාලම ඉදිකිරිම | උලපනේ | උලපනේ උතුර මල්වත්ත ගම | ප්‍රදේශ වාසින් | 300000 | 00 | පවුල් 15 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 25 | රජඇල තේ කර්මාන්ත ශාලාව අසල කෝවිල සෑදිම | උලපනේ | උලපනේ | ප්‍රදේශ වාසින් | 150000 | 00 | පවුල් 21 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 26 | රජඇල වේල්ල සිට දුම්රිය පාරට වැටි ඇති පඩිපෙළ සෑදිම | උලපනේ | උලපනේ | ප්‍රදේශ වාසින් | 150000 | 00 | ප්‍රතිල ාභින් 25 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 27 | තලේගොඩ පිහිල්ල ලග පාර සංවර්ධනය කිරිම | උලපනේ | උලපනේ | ප්‍රදේශ වාසින් | 150000 | 00 | ප්‍රතිල ාභින් 25 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 28 | සෙවිලි තහඩු ලබාදිම | උලපනේ | උලපනේ | ප්‍රදේශ වාසින් | 250000 | 00 | ප්‍රජා ව | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 29 | පරගල ගමමැද පාර සංවර්ධනය කිරිම | රාක්ෂාව | පරගල | ප්‍රදේශ වාසින් | 1500000 | 00 | ප්‍රතිල ාභින් 60 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 30 | වැලිකන්ද බාලේ මහතාගේ නිවස දෙසට යන පාර ආරම්භයේ පාලම සංවර්ධනය කිරිම | ගල්පාය | වැලිකන්ද | ප්‍රදේශ වාසින් | 500000 | 00 | ප්‍රතිල ාභින් 45 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 31 | ගල්පාය උඩකොළනිය පඩිපෙළ සංවර්ධනය කිරිම | ගල්පාය | උඩකොළ ණිය | ප්‍රදේශ වාසින් | 250000 | 00 | ප්‍රතිල ාභින් 43 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 32 | පහළ කොළණියේ රතිල් මහතාගේ නිවස අසළ බැම්ම සංවර්ධනය කිරිම | ගල්පාය | පහළකො ළණිය | ප්‍රදේශ වාසින් | 250000 | 00 | ප්‍රතිල ාභින් 26 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 33 | මලන්ගමුව පාලම අසල සිට උපතිස්ස මහතාගේ නිවසට යන පාර සංවර්ධනය කිරිම | ගල්පාය | මලන්ගමු ව | ප්‍රදේශ වාසින් | 500000 | 00 | ප්‍රතිල ාභින් 15 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 34 | රජඇල හොරගස් ඇල්ල මාර්ගය සංවර්ධනය කිරිම | පැල්ලපිටි ය | රජඇල | රජඇල සමෘද්ධි සමිතිය | 400000 | 00 | පවුල් 30 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 35 | මැදහින්න මාර්ගය සංවර්ධනය කිරිම | පැල්ලපිටි ය | කොලුවල | කොලුව ල පහළ ගම්වා සින් | 300000 | 00 | පවුල් 16 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 36 | රජ ඇලගමට පානීය ජලය ලබාදීම | පැල්ලපිටි ය | රජඇල | රජඇල සමෘද්ධි සමිතිය | 200000 | 00 | පවුල් 30 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 37 | ස්වේච්ඡා සමිතිවලට භාණ්ඩ ලබාදීම | පැල්ලපිටි ය | පැල්ලපිටි ය උතුර හා දකුණ | සමිති | 400000 | 00 | පවුල් 25 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 38 | කොලුවල සමර්සෙට් මාර්ගය සංවර්ධනය කිරිම | පැල්ලපිටිය | කොලුවල | ප්‍රදේශ වාසීන් | 200000 | 00 | පවුල් 15 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 39 | ගිරාවුල්ල ප්‍රධාන පාරේ සිට ගිරාවුල්ල පුරාණ විහාරය හරහා මලංගමුවට යන මාර්ගය සංවර්ධනය කිරිම | මල්වත්ත ගම | ගිරාවුල්ල | ප්‍රදේශ වාසීන් | 700000 | 00 | පවුල් 17 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 40 | කලාපයේ පොදු සමිති සදහා භාණ්ඩ ලබා දීම | මල්වත්ත ගම | ගිරාවුල්ල | සමිති ඉල්ලීම | 500000 | 00 | පවුල් 50 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 41 | මල්වත්තගම බුදුමැදුර ප්‍රතිසංස්කරණය කිරිම | මල්වත්ත ගම | මල්වත්ත ගම | ප්‍රදේශ වාසීන් | 250000 | 00 | ප්‍රජාව | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 42 | ගිරාවුල්ල ලියන්නවත්ත අතුරු මාර්ගය සංවර්ධනය කිරිම | මල්වත්ත ගම | ගිරාවුල්ල | ප්‍රදේශ වාසීන් | 300000 | 00 | පවුල 28 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 43 | තාමරවල්ලිය හරහා ගෝනවත්තට යන මාර්ගය සංවර්ධනය කිරිම | පටිතලාව | තාමරවල්ලි | ප්‍රදේශ වාසීන් | 200000 | 00 | පවුල් 15 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 44 | උඩුවැල්ල තිබ්බටුපොල මාර්ගය සංවර්ධනය කිරිම | පටිතලාව | උඩුවැල්ල | ප්‍රදේශ වාසීන් | 200000 | 00 | පවුල් 17 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 45 | බෙරවිල ගම මැද මාර්ගය සංවර්නය කිරිම | පටිතලාව | බෙරවිල | ප්‍රදේශ වාසින් | 400000 | 00 | පවුල් 32 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 46 | කටාරම් ජනපද මාර්ගය සංවර්ධනය කිරිම | පටිතලාව | කටාරම් ජනපදය | ප්‍රදේශ වාසින් | 200000 | 00 | පවුල් 22 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 47 | මල්ගොල්ල E කොටස මාර්ගය සංවර්ධනය කිරිම | පටිතලාව | මල්ගොල්ල | ප්‍රදේශ වාසින් | 500000 | 00 | පවුල් 25 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 48 | මියනගොල්ල ගම මැද මාර්ගය සංවර්ධනය කිරිම | දොලොස් බගේ | මියනගොල්ල | ප්‍රදේශ වාසින් | 500000 | 00 | පවුල් 26 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 49 | බහු කාර්යය ගොඩනැගිල්ල ඉදි කිරිම | දොලොස් බගේ | මියනගොල්ල | ප්‍රදේශ වාසින් | 500000 | 00 | පවුල් 20 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 50 | කෙලිගඖප් ගම මැද මාර්ගය සංවර්ධනය කිරිම | දොලොස් බගේ | කෙලිගඖප් | ප්‍රදේශ වාසින් | 500000 | 00 | පවුල් 20 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 51 | ගම්පොලවෙල අබූක්කරා වත්ත පාර අන්සාර් මහතාගේ නිවස ඉදිරියට සංවර්ධනය කිරිම | ගම්පාලවෙල | ගම්පාලවෙල | ප්‍රදේශ වාසින් | 250000 | 00 | පවුල් 30 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **52** | ගම්පාවෙල කොට්ඨාශයේ ගනේවත්ත වමිලා මහත්මියගේ නිවස ඉදිරි පිට පාර සංවර්ධනය කිරිම | ගම්පාලෙ වල | ගම්පොල වෙල | ප්‍රදේශ වාසින් | 100000 | 00 | පවුල් **25** | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | **2022.12.31** |
| **53** | ගම්පොලවෙල ගගේවත්ත රත්නායක මහතාගේ නිවස අසල සිට ඉදිරියට යන පාර සංවර්ධනය කිරිම | ගම්පොල වෙල | ගම්පොල වෙල | ප්‍රදේශ වාසින් | 150000 | 00 | පවුල් **24** | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | **2022.12.31** |
| **54** | රජ ඇලගම ජේ විජය කුමාරි මහත්මියගේ නිවස අසල පාර සංවර්ධනය කිරිම | ගම්පොල වෙල | රජ ඇලගම | ප්‍රදේශ වාසින් | 500000 | 00 | පවුල් **20** | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | **2022.12.31** |
| **55** | මාලිගාපුරන කුමුක් ගැටේ බෝගහලග සිට ඉදිරියට පාර සංවර්ධනය කිරිම | ගම්පොල වෙල | මිාලිගාපු රන | ප්‍රදේශ වාසින් | 200000 | 00 | පවුල් **21** | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | **2022.12.31** |
| **56** | ඇත්ගාල පන්සල අසල උඩපාර ඉන්දික මයාගේ නිවස ඉදිරි පිට සිට ඉදිරියට සංවර්ධනය කිරිම | ගම්පොල වෙල | ඇත්ගාල | ප්‍රදේශ වාසින් | 300000 | 00 | පවුල් **25** | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | **2022.12.31** |
| **57** | හලාගම සොහොන් පිටිය අසල සිට දුම්රිය මාර්ගයට සමාන්තරව වරකාපිටිය දක්වා දිවෙන මාර්ගය පස් කපා බෝක්කු බැඳ සංවර්ධනය කිරිම | තැඹිලිගල | හලාගම | ප්‍රදේශ වාසින් | 800000 | 00 | පවුල් **200** | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | **2022.12.31** |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 58 | උඩගම රජපක්ෂ මහතාගෙ නිවස අසල සිට චාමර මහතාගේ නිවස දෙසට යන මාර්ගය තාර දමා සංවර්ධනය කිරිම | තැඹිලිගල | උඩගම | ප්‍රදේශ වාසින් | 250000 | 00 | පවුල් 150 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 59 | දිළිදු පවුල් සඳහා සෙවිලි තහඩු ලබා දීම | තැඹිලිගල | තැඹිලිගල | ප්‍රදේශ වාසින් | 250000 | 00 | පවුල් 175 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 60 | කහටගස්තැන්න පොදු ළිද සංවර්ධනය කිරිම | තැඹිලිගල | කහටගස් තැන්න | ප්‍රදේශ වාසින් | 200000 | 00 | පවුල් 200 | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| 61 | බලප්‍රදේශයේ බොදු සංවර්ධන කටයුතු | ගඟ ඉහල | ගඟඉහල | ප්‍රදේශ වාසින් | 2000000 | 00 | ප්‍රජා ව | අංශ ප්‍රධාන සංවර්ධන සහ තාක්ෂණ නිලධාරින් /විෂය නිලධාරි | සභාපති / ලේකම් | 2022.12.31 |
| | එකතුව | | | | **22250000** | 00 | | | | |

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා</u>

**එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.**

<u>ගරු සභාපතිතුමා</u>

**2022 වර්ෂයේ සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලද සංවර්ධන යෝජනා සංශෝධනය කර ඉහත නව යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.**

<u>ගරු සභාපතිතුමා</u>

**වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.**

තීරණය:-

**ඒ අනුව 2022 වර්ෂයේ සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලද සංවර්ධන යෝජනා සංශෝධනය කර ඉහත නව යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

05:01:05 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ අංක 13 කඩ කාමරය බදු දීමේදී බදුකරු විසින් ගෙවනු ලැබූ එක්වන් මුදලින් වැඩිපුර අයකර ඇති රුः 830,000.00 ක මුදල මාසික කඩ කුලිය වන රුः 6500.00 බැගින් වාර්ෂිකව රුः78,000.00 ක් සෑම වර්ෂයකටම වරක් ගෙවීම් වවුචරයක් මගින් කඩ කුලී සඳහා හිලව් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ අංක 13 කඩ කාමරය බදු දීමේදී බදුකරු විසින්ගෙවනු ලැබූ එක්වන් මුදලින් වැඩිපුර අයකර ඇති රුः 830,000.00 ක මුදල කඩ කුලී සඳහා හිලව් කිරීමට අවශ්‍යව ඇති බැවින් මාසික කඩ කුලිය වන රුः 6500.00 බැගින් වාර්ෂිකව රුः78,000.00 ක් සෑම වර්ෂයකටම වරක් ගෙවීම් වවුචරයක් මගින් කඩ කුලී සඳහා හිලව් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යෝජ්ඩනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය:-

**ඒ අනුවගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ අංක 13 කඩ කාමරය බදු දීමේදී බදුකරු විසින් ගෙවනු ලැබූ එක්වන් මුදලින් වැඩිපුර අයකර ඇති රුः 830,000.00 ක මුදල මාසික කඩ කුලිය වන රුः 6500.00 බැගින් වාර්ෂිකව රුः78,000.00 ක් සෑම වර්ෂයකටම වරක් ගෙවීම් වවුචරයක් මගින් කඩ කුලී සඳහා හිලව් කිරීම සුදුසු බවට ගරු මහා සභාවතීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

06. යථාපරිදි කල්දී නොමැති යෝජනා /හදිසියෝජනා - ඇත

06:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

මහනුවර දිස්ත්‍රික්කයේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි කුරුඳුවත්ත නැමති ඉඩමට අදාළව බලයලත් මිනින්දෝරු පී.පී.වී. සුනිල් කුසුම්සිරි මහතා විසින් මැන සකස් කරන ලද අංක 8707 හා 2007.02.10 වන දින දරණ පිඹුරේ කැබලි අංක 01,02,03 හා 04 මගින් දැක්වෙන අක්කර 01 රූඩ් 3 පර්චස් 5.26ක ඉඩම් ප්‍රමාණය 2007 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ 22(1) ආ වගන්තිය යටතේ විකිණීමේ පදනම මත පවරාදීමට 2018.10.11 දිනැති කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව එම ඉඩම අප ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සඳහා පහත සඳහන් තක්සේරුව අනුව අදාළ ගෙවීම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ඉඩමට අදාළ තක්සේරු වටිනාකම - රු: 9,984,000.00

තක්සේරු හා සේවා ගාස්තුව රු: 9,250.00

එකතු කළ අගය මත 8% බද්ද රු: 740.00 - රු: 9,990.00

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

වෙත ගෙවිය යුතු මුළු මුදල - රු: 9,993,990.00

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මහනුවර දිස්ත්‍රික්කයේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි කුරුඳුවත්ත නැමති ඉඩමට අදාළව බලයලත් මිනින්දෝරු පී.පී.වී. සුනිල් කුසුම්සිරි මහතා විසින් මැන සකස් කරන ලද අංක 8707 හා 2007.02.10 වන දින දරණ පිඹුරේ කැබලි අංක 01,02,03 හා 04 මගින් දැක්වෙන අක්කර 01 රූඩ් 3 පර්චස් 5.26ක ඉඩම් ප්‍රමාණය 2007 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ 22(1) ආ වගන්තිය යටතේ විකිණීමේ පදනම මත පවරාදීමට 2018.10.11 දිනැති කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. එම තීරණයට අනුව අප සභාව විසින් රු:9,993,990.00 ක මුදලක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවීමට සිදුව ඇත. මෙම ඉඩම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට පිහිටි රථගාල, කුරුඳුවත්ත නගරයේ ළමා උද්‍යානය, බස් නැවතුම්පොළ, ත්‍රී රෝද රථ නැවතුම්පොළ. ආයුර්වේද ගොඩනැගිල්ල සහ ඔසු උයන සහ පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල පිහිටි භූමිය අයත් වෙනවා. කෙසේ වෙතත් එම ඉඩම සභාව වෙත පවරා ගැනීම කාලීන අවශ්‍යතාවයක් බැවින් 2007 වර්ෂයේ මැනුම් කටයුතු සිදු කළ ඉඩම් වපසරියට අදාළ මුදල් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවා කුරුඳුවත්ත නැමති ඉඩම අප ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා

ගරු සභාපතිතුමනි, කාලයක් තිස්සේ විසඳා ගත නොහැකිව තිබූ ගැටළුවක් විසඳා ගැනීමට හැකි වීම පිළබඳව මාගේ සතුට පළ කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

ගරු සභාපතිතුමනි, අප සභාවට අයත් ඉඩම් විවිධ පුද්ගලයන් විසින් අත්පත් කර ගැනීමට යන අවස්ථාවක මෙම ඉඩම අප වෙත පවරා ගැනීමට හැකිවීම අප ලද ජයග්‍රහණයක් වෙනවා. මෙම භූමිය අප සභාව වෙත පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් මා ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමා

ගරු මහා සභාවේ සියලු දෙනාගේ ඒකමතික තීරණය වෙන්නේ මෙම මුදල හැකිතාක් ඉක්මනින් ගෙවා අදාළ ඉඩම අප ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු යොදන ලෙසයි. වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය:-

ඒ අනුවමහනුවර දිස්ත්‍රික්කයේ ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි කුරුඳුවත්ත නැමති ඉඩමට අදාළව බලයලත් මිනින්දෝරු පී.පී.වී. සුනිල් කුසුම්සිරි මහතා විසින් මැන සකස් කරන ලද අංක 8707 හා 2007.02.10 වන දින දරණ පිඹුරේ කැබලි අංක 01,02,03 හා 04 මගින් දැක්වෙන අක්කර 01 රූඩ් 3 පර්චස් 5.26ක ඉඩම් ප්‍රමාණය 2007 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ 22(1) ආ වගන්තිය යටතේ විකිණීමේ පදනම මත පවරාදීමට 2018.10.11 දිනැති කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති අතර එම ඉඩම අප ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීම සඳහා ඉඩමට අදාළ තක්සේරු වටිනාකම රු: 9,984,000.00ක්ද තක්සේරු හා සේවා ගාස්තුව රු: 9,250.00 ක්ද එකතු කළ අගය මත 8% බද්ද රු: 740.00ක්ද ඇතුළුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු මුළු මුදල වන රු: 9,993,990.00 ක තක්සේරු කරන ලද මුදල ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවා කඩිනමින් මෙම ඉඩම සභාව වෙත පවරා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවතීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 07. කාරක සභා වාර්තා සලකා බැලීම

### 01.මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව

2022.03.08 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා ගත කරන ලදි. ඒ අනුව 2022 වර්ෂයට අදාළ ආදායම් වියදම් පුරෝකථනයද, 2022 පෙබරවාරි මස මුළු ලැබීම් රු:8,827,178.86ක්ද මුළු වියදම රු:25,316,530.37 ක්ද විය. 2022 පෙබරවාරි මසට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශයද 2022.03.15 වන දින මහනුවර විගණන අධිකාරි වෙත යොමුකර ඇත.

## 08.සභාවේ මාසික ලැබීම් හා ගෙවීම් වාර්තාව

2022.03.07 සිට 2022.03.08 වනදින දක්වා ගෙවීම් වාර්තාව සභාගත කරන ලදි.

| අනු අංකය | දිනය | ආදයකයා | ගෙවීම් විස්තරය | වවුචර අංකය | හරස් සටහන් | මුදල |
|---|---|---|---|---|---|---|
| **1** | **2022-03-07** | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | කුරුදුවත්ත මහජන පුස්තකාලයේ 2022 ජනවාරි මස විදුලි බිල ගෙවීම. | 235 | | **331.50** |
| **2** | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | කුරුදුවත්ත මහජන පුස්තකාලයේ 2022 පෙබරවාරි මස විදුලි බිල ගෙවීම. | 236 | | **349.80** |
| **3** | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | කුරුදුවත්ත ජල පොම්පයේ 2022 ජනවාරි මස විදුලි බිල ගෙවීම | 237 | | **4,796.70** |
| **4** | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | කායවර්ධන මධ්‍යස්ථානයේ 2022 ජනවාරි මස විදුලි බිල ගෙවීම | 238 | | **898.80** |
| **5** | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | උලපනේ මහජන පුස්තකාලයේ 2022 ජනවාරි මස විදුලි බිල ගෙවීම. | 239 | | **514.50** |
| **6** | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ 2022 පෙබරවාරි මස විදුලි බිල ගෙවීම. | 240 | | **9,334.30** |
| **7** | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | ඇත්ගාල ක්‍රීඩා පිටියේ 2022 ජනවාරි මස විදුලි බිල ගෙවීම | 241 | | **313.20** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 8 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | ප්‍රා. සභා නව ගොඩනැගිල්ලේ 2022 ජනවාරි මස විදුලි බිල ගෙවීම | 242 | | 8,785.90 |
| 9 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | ප්‍රා. සභා නව ගොඩනැගිල්ලේ 2022 පෙබරවාරි මස විදුලි බිල ගෙවීම | 243 | | 10,042.65 |
| 10 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | කුරුදුවත්ත ක්‍රීඩා පිටියේ 2022 ජනවාරි මස විදුලි බිල ගෙවීම | 244 | | 1,008.60 |
| 11 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | ප්‍රා. සභා පැරණි කාර්යාලයේ 2022 ජනවාරි මස විදුලි බිල ගෙවීම | 245 | | 17.55 |
| 12 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | උලපනේ කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ 2022 පෙබරවාරි මස විදුලි බිල ගෙවීම | 246 | | 2,381.10 |
| 13 | | මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම - මහනුවර | කුරුදුවත්ත ආයුර්වේදයේ 2022 ජනවාරි මස විදුලි බිල ගෙවීම | 247 | | 368.10 |
| 14 | | සමගි ප්‍රජා මූල සංවිධානය - කුරුදුවත්ත | කුරුදුවත්ත ප්‍රාදේශීය සභා ක්‍රීඩා පිටියේ ජල බිල ගෙවීම. 2022- ජනවාරි | 248 | | 2,820.00 |
| 15 | | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය , පේරාදෙණිය | ඇත්ගාල ක්‍රීඩා පිටියේ 2022 ජනවාරි මස ජල බිල්පත් ගෙවීම | 249 | | 1,164.06 |
| 16 | | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය , පේරාදෙණිය | උලපනේ උප කාර්යාලයේ 2022 ජනවාරි මස ජල බිල්පත් ගෙවීම | 250 | | 712.44 |
| 17 | | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය , පේරාදෙණිය | ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ 2022 ජනවාරි මස ජල බිල්පත් ගෙවීම | 251 | | 2,338.20 |
| 18 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357689 අංක දරණ කාර්යාලයේ දුරකථන ගාස්තු ගෙවීම - 2022 ජනවාරි | 252 | | 12,013.48 |
| 19 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357117 අංක දරණ කාර්යාලයේ දුරකථන ගාස්තු ගෙවීම - 2022 ජනවාරි | 253 | | 3,010.24 |
| 20 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357117 අංක දරණ කාර්යාලයේ දුරකථන ගාස්තු ගෙවීම - 2022 පෙබරවාරි | 253 | | 2,667.20 |
| 21 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357015 අංක දරණ කුරුදුවත්ත පුස්තකාලයේ රවුටරය සඳහා බිල්පත ගෙවීම - 2022 ජනවාරි | 255 | | 1,459.17 |
| 22 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357082 අංක දරණ ගරු උප සභාපතිතුමාගේ කාමරයේ දුරකථන ගාස්තු ගෙවීම - 2022 ජනවාරි | 256 | | 965.36 |
| 23 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2352123 අංක දරණ ඇත්ගාල උප කාර්යාලයේ දුරකථන ගාස්තු ගෙවීම - 2022 ජනවාරි | 257 | | 669.41 |
| 24 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357510 අංක දරණ ගරු සභාපතිතුමාගේ කාමරයේ දුරකථන ගාස්තු ගෙවීම - 2022 ජනවාරි | 258 | | 1,552.37 |
| 25 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357690 අංක දරණ ඊ නැණ පියස දුරකථන ගාස්තු ගෙවීම - 2022 ජනවාරි | 259 | | 345.40 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 26 | 2022-03-08 | ඩබ්.එම්.එම් බණ්ඩාර මයා (කොන්ත්‍රාත් - තාක්‍ෂණ නිලධාරි ) | පරිවර්තිත ගමන් වියදම් දීමනාව ගෙවීම. - 2022 ජනවාරි | 260 | | 12,200.00 |
| 27 | | බී.පී.ටී දිසානායක මයා - සංවර්ධන නිලධාරි | පරිවර්තිත ගමන් වියදම් දීමනාව ගෙවීම. - 2022 පෙබරවාරි | 261 | | 4,700.00 |
| 28 | | පී.පී.එස්.ජේ කිත්සිරි මයා - පරිසර නිලධාරි | පරිවර්තිත ගමන් වියදම් දීමනාව ගෙවීම. - 2022 ජනවාරි | 262 | | 4,700.00 |
| 29 | | පී.පී.එස්.ජේ කිත්සිරි මයා - පරිසර නිලධාරි | 2022.01.07,08, දින වල රාජකාරි කටයුතු සඳහා මහනුවර යාම හා 27 දින නවයාලතැන්න යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම . | 263 | | 2,600.00 |
| 30 | | කේ.කේ.පී.එස්.එම්.කාරියවස ම් මෙනවිය - කලමණාකාර සේවා නිලධාරි (වැටුප්) | 2022.02.24 දින පුහුණු සැලසුම්කරණය පිළිබඳ පුහුණු වැඩසටහනට (පොල්ගොල්ල) යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම . | 264 | | 906.00 |
| 31 | | ඩී.එම්.එල්.ඩී දසනායක මිය - ලේකම් | 2022.02.24 දින පුහුණු සැලසුම්කරණය පිළිබඳ පුහුණු වැඩසටහනට (පොල්ගොල්ල) යාම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම . | 265 | | 1000.00 |
| 32 | | ආර්.පී.දසනායක රාජපක්‍ෂ මයා - මාර්ග කම්කරු ( වැඩ මූලික ) | ගල්පාය ජල යෝජනා ක්‍රමයේ ජල නල අලුත් වැඩියා කිරීම වෙනුවෙන් අතින් වියදම් වූ මුදල් ගෙවීම. | 266 | | 1,000.00 |
| 33 | | ඉමල්කා නිලක්ෂණී ජයපාල මිය | 2022.03.08 දිනට යෙදුන කාන්තා දිනයේ පැවති ඉවුම් පිහුම් වැඩසටහන මෙහෙයවීම වෙනුවෙන් සම්පත් දයක දීමනාව ගෙවීම. | 267 | | 2,500.00 |
| 34 | | ඩී.කේ.සුදර්ශනී කුමාරි මෙනවිය - කළමනාකරණ සේවා නිලධාරි (ගිණුම්) | නිවසේ අලුත් වැඩියා කටයුත්තක් සඳහා ආපදා ණය මුදල ගෙවීම. | 268 | | 52,500.00 |
| 35 | | පී.කේ පී.ඩබ්. බණ්ඩාර මයා - ගම්පොල | ගිණුම් අංශයේ අක්‍රිය පරිඝණක සකස් කිරීමට අවශ්‍ය උපාංග ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 269 | | 2,200.00 |
| 36 | | යුනයිටඩ් මෝටර්ස් ලංකා පී. එල්. සී - මහනුවර | WPPF 7455 කැබ්රථයේ 209258 කි.මී සේවා වාරය සිදු කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 270 | | 20,726.93 |
| | | එකතුව | | | - | 173,798.96 |

<u>09. වෙනත්</u>

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.ආනන්ද කුලතිලක මහතා අසනීපවීම හේතුවෙන් අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

නිවාඩු අනුමත කරන ලදි.

02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා අසනීපවීම හේතුවෙන් අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

නිවාඩු අනුමත කරන ලදි.

ගරු සභාපතිතුමා

උළපනේ ඩෙන්මාර්ක් කසළ අංගනයේ වැට සහ මුරකුටිය ඉදිකිරීම කර්මාන්තයේ වැඩ අවසන් කර ඇති නමුත් තවමත් එම ව්‍යාපෘතියේ මුදල් නොගෙවීම හේතුවෙන් ඒ සඳහා අත්තිකාරම් මුදලක් හෝ ලබා දෙන ලෙස ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය විසින් ඉල්ලීමක් කර ඇත. සභාවේ මුදල් තත්ත්වය සළකා බලා අදාළ මුදල් ගෙවීමට කටයුතු කරන බව දැනුම් දෙමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, සෑම වර්ෂයකම භාණ්ඩ සමීක්ෂණයක් මගින් භාණ්ඩ වෙන්දේසි කිරීම, වෙන්දේසි භාණ්ඩ විකිණීම වැනි දෑ සිද්ධ වෙනවා. මෙම වෙන්දේසි වලදී ලංකාවෙම එකම කණ්ඩායමක් සහභාගී වෙනවා. ඒ අයම මිළ තීරණය කරනවා. ඒ අයම එම වෙන්දේසියේ භාණ්ඩ මිළට ගෙන විකුණනවා. අපේ අවට ඉන්න පුද්ගලයින්ට මෙම අවස්ථාව ලබා දීමයි අපි කළ යුත්තේ. නිවැරදි මුදල සභාවට එන්නෙත් නෑ. තවද, කුරුඳුවත්ත ක්‍රීඩාපිටිය සහ ඇත්ගාල ක්‍රීඩාපිටියේ තණකොළ මැරෙනවා. ඒවායේ CCTV කැමරා පද්ධතිය වැඩ නෑ. ඇයි ඒ කැමරා පිච්චෙන්නේ. එම කම්පැණි දැනුවත් කර ඒවාට වැඩ පිළිවෙලක් යොදන්න. අඩුම තරමේ අකුණු සන්නායකයක් සවි කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා

ගරු සභාපතිතුමනි, අසුපිණි ඇල්ල ප්‍රදේශයේ ඉඩම් වගයක් බලෙන් අත්පත් කර ගන්න යනවා කියලා ආරංචියක් ලැබුණා. එම ඉඩම් කිසිවෙකුට අත්පත් කරගන්න ඉඩ දෙන්න එපා. මෙය ජල පෝෂක ප්‍රදේශයක්. අතීතයේ ශ්‍රී ලංකාව තුළසෙංගමාලය රෝගය ව්‍යාප්ත වන වකවාණුවේ අරණායක ප්‍රදේශයේ ජනතාව එම රෝගයටබොහෝ සේ ගොදුරු වුණා. ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිසරය ආරක්ෂා කර ගැනීමට මෙම සභාව නියෝජනය කළ සියලුම ගරු සභාපතිවරු දායක වුණා. අපගේ මෙම සුන්දර පරිසරය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙල යොදන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. 2001 වර්ෂයේ සිටම අසුපිණි ඇල්ලට වියදම් කරනවා. මෙයින් සභාවට ආදායමක් උපයා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

ගරු සභාපතිතුමනි, වනජීවී දෙපාර්තමේන්තුවෙන් යැයි කියමින් පිරිසක් ඇවිත් රහලගලිනුත් ඉඩම් අල්ලනවා. මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙස ඉල්ලීමක් කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, අසුපිණි ඇල්ල ප්‍රදේශය සංචාරක ප්‍රදේශයක් කිරීමටහිටපු ප්‍රාදේශීය සභා සභාපති මහින්දරත්න අලුත්ගමගේ මහතා විශාල වැඩ පිළිවෙලක් යෙදුවා. පතිරණ මන්ත්‍රීතුමා ඒ සම්බන්ධයෙන් මුල ඉඳලම කටයුතු කළා. පසුකාලීනව එම ප්‍රදේශය යම් යම් දේශපාලන පක්ෂ නියෝජතයින් නිවාස ඉදි කළා. දැන් ඒවායේ නිවාස රාශියක් ඉදි වෙලා. ඇපලවත් පාලම ලග සිට නිවාස හදලා වැසිකිළි 05ක් හදලා තියෙනවා. ඒවා ජල පෝශක ප්‍රදේශ. අපට තිබෙන ඉඩම් වලට කෑගල්ල ප්‍රාදේශීය ලේකම් ඔප්පු දුන්නා. එම නීතියානුකූල අයිතිය අපිට අද නැති වෙලා. සරත් කුමාර මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට අපි අසුපිණි ඇල්ල ප්‍රදේශයෙන් ආදායම් වැඩි කර ගැනීමට වැඩ පිළිවෙල යොදලා අවසන්. ආදායම් උත්පාදනය කර ගනිමින් පරිසරයත් රැකගෙන අසුපිණි ඇල්ල ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කටයුතු යොදන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

ගුණරත්න මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට අසුපිණි ඇල්ල අපට ඉතාම වටිනා ස්ථානයක්.එහි ඉතා විශාල වැඩක් කරන්න තියෙනවා. අපි එයට විශේෂ අවධානයක් යොමු කරමු. එය අපි ආරක්ෂා කර ගනිමු. හැකි අයුරින් මෙම ව්‍යාපෘතිය අවසන් කරන බව මා ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමා

අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්ත වනබව ප්‍රකාශ කරන ලදි. අද දින සභාවාරය සාර්ථකව පවත්වාගෙනයාමට සහාය ලබාදුන් සියලුදෙනාටත් ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුදෙනාටත් ස්තූතිවන්ත වෙමින් ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු පෙ:ව: 11.30 ට අවසන් කරන ලදි.

සභාපති

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2022.03.15 වනදින ගඟ ඉහළ කෝරළේ

ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදීය